# නයිල් නිම්නයේ දඩකෙළි

ආර්.ඒ. ප්‍රමිත් මධුසංඛ

මානව ඉතිහාසයේ මහත් පෙරලියක් සිදු කළ නැගෙනහිර අප්‍රිකානු කලාපය හරහා ගලාබසිනා නයිල් නිම්නය පාදක කොට ගනිමින් D.R පොන්නම්පෙරුම විසින් මර්ලින් පීරිස් ගේ " The Black Land " කෘතියෙහි පරිවර්තනයක් ලෙසට පිටු 160 ක් පුරාවට දිග හරින ලද ''පැරණි මිසරය'' නම් කෘතියෙහි අඩංගු ඉපැරණි විශ්‍රාන්තිමය අත්දැකීම්හි සංශිප්ත සටහනක් මෙලෙස දිග හරිමු.

ඉපැරණි නයිල් නිම්න වැසියා සිය විවේකය හා විනෝදය උදෙසා සිදු කරනු ලැබු විවිධ ක්‍රියාකාරකම් ක්‍රීඩා හා විශ්‍රාන්ති ක්‍රියාවලියක් බවට පරිවර්තනය වුයේ නිතැතිනි. නයිල් නිම්න ශිෂ්ටාචාරය තුළ මෙම ක්‍රීඩා හා විශ්‍රාන්ති ලක්‍ෂණයන්ගෙන් යුත් විවිධ වූ ක්‍රියාකාරකම් රාශියක් හඳුනාගත හැකිය. මෙම සියලු ක්‍රියාකාරකම් මොවුන්ගේ දෛනික දිවිය හා පරිසරය සමඟ සමීපව පැවතීම සුවිශේෂීතම ලක්‍ෂණයකි.
ඉපැරණි නයිල් නිම්නයේ විශ්‍රාන්තිමය දෛනික ක්‍රියාකාරකමක් වූ දඩයම විශේෂයෙන් සාමාන්‍ය ජනයා මෙන්ම රජවරු අතර පවා පැවති අතර මේ සඳහා අපමණ සාක්ෂි ඉතිහාසය දරනු ලබයි. IV වන තොට්මෝසේ රජුගේ ශිලා ලේඛනයක, රජු දඩයමේ ගිය අවස්ථාවක් සඳහන් වේ. තවද III වන අමෙන්හොටෙප් රජු සිංහයන් දඩයමේ ගිය බවද සඳහන් වේ. එසේම ඉපැරණි නයිල් නිම්නයේ පක්ෂි දඩයමද පැවතිනි. පක්ෂි දඩයම නයිල් නිම්න ඉතිහාසයේ පටන් කොපමණ සංවර්ධනය වුයේ ද යත් ක්‍රි.ව. 1900 දී පැවති II වන නුතන ඔලිම්පික් උළෙලෙහි පවා එක් ක්‍රිඩා ඉසව්වක් ලෙසට පක්ෂි දඩයම පවත්වනු ලැබීය. මෙම දඩයම් පිළිබඳව මෙම කෘතියෙහි ඇත්තේ මෙවන් සටහනකි. ''නිම්නය වටා සිවුපාවුන්ගේ, කුරුල්ලන්ගේ සහ ගස්වල කැටයම් වලින් සහ දඩයම්.... '' දඩයම හෙවත් දඩකෙළිය ඉපැරණි මිසරයේ අපූර්ව විශ්‍රාන්තිමය ක්‍රියාකාරකමක් වුයේ ද යත් මසුන් ඇල්ලීම මෙකල බෙහෙවින් සිදු කරනු ලැබීය. මසුන් දඩයම සඳහා භාවිතා වූ බිලිපිති, බිලිකොකු හා මසුන් ඇල්ලීමේ සිතුවම් ආදිය ඉපැරණි නයිල් නිම්නය ආශ්‍රිතව හමු වී ඇත. නයිල් ගංගාව සහ මධ්‍යධරණී මුහුද ආශ්‍රිතව මසුන් දඩයමෙහි බහුලව නිරත වී ඇත. මෙසේ වීමට හේතුව ඉපැරණි නයිල් නිම්නය දෙකඩ කරමින් නයිල් ගංගාව ගලා යාමත් නයිල් නිම්නයට උතුරින් මධ්‍යධරණී මුහුද පිහිටා තිබීමත් නිසාවෙනි. අතීත නයිල් නිම්නයේ තවත් විශ්‍රාන්තිමය ක්‍රියාකාරකමක් ලෙසට සත්ව හා මිනිස් සටන් හඳුනාගත හැකිය. මෙම සටන් නැරඹීමද ජනප්‍රිය අංගයක් විය. නයිල් ගඟබඩට දිය බීමට පැමිණෙන සතුන්ගේ පොරබැදීම් නැරඹීම මෙකල බහුලව සිදු වී තිබේ. මෙහි ආභාෂයෙන් පසු කාලීනව බොක්සින් මල්ලවපොර ආදී විවිධ ක්‍රීඩා ක්‍රියාකාරකම් ද ස්පාඤ්ඤයේ ප්‍රකට ගවපොර ආදී සතුන් හා බැදී පවතින විවිධ විනෝදාත්මක ක්‍රියාකාරකම් ද බිහි වූවා යැයි අනුමාන කළ හැකිය. .පුරාවිද්‍යාඥයින් සොයාගෙන ඇති ආකාරයට එක්තරා පලකයක බිම වැටී සිටින පුද්ගලයෙකුට ගවයකු අනින අයුරු ද පරාජයට පත් වූ සතුරාට පහර දෙමින් පාගා දමන සිංහයන්ගේ සහ ගෝනුන්ගේ දර්ෂණ ද තුළින් පැහැදිලි වනුයේ මෙකල පැවති විවිධ දඩයම් අවස්ථා හා සටන් පිළිබඳවය. මෙහි ආභාෂයක් ලෙසට පසුකාලීනව ලොව පුරා ජනප්‍රියත්වයට පත්ව තිබෙන දඩයම හා දුනු විදීම වැනි විශ්‍රාන්තිමය ක්‍රීඩා ඉසව් බිහි වීම හඳුනා ගත හැකිය.

මෙවැනි ආකාරයේ විශ්‍රාන්තිමය ක්‍රියාවන්හි නිරත වූ ඉපැරණි නයිල් නිම්න වැසියා ලොවට දායාද කළ අපූර්ව ක්‍රීඩා හා විශ්‍රාන්තිමය හැකියාවන් ඉපැරණි ඉතිහාසයේ පටන් අද දක්වාම නොනැසී ලොව පුරා ව්‍යාප්ත වෙමින් පවතී.

පොන්නම්පෙරුම D.R , 2002, ඉපැරණි මිසරය , ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී. ද එස්. කුලරත්න මාවත, කොළඹ 10.